**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**
***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියාව ශ්‍රී ලංකාවට කොවිෂීල්ඩ් එන්නත් පරිත්‍යාග කරයි</u>**

**ඉන්දීය රජයේ #වැක්සින්මෛත්‍රී වැඩසටහන යටතේ ඉන්දියාවේ නිෂ්පාදනය කරන ලද කොවිෂීල්ඩ් එන්නත් මාත්‍රා 500,000ක් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කිරීමට කටයුතු යොදා ඇත. මෙම එන්නත් තොගය 2021 ජනවාරි 28 වන දින විශේෂ එයාර් ඉන්ඩියා ගුවන් යානයක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කෙරෙනු ඇති අතර එන්නත් ප්‍රවාහනය සඳහාම සුවිශේෂී වූ ඇසුරුම් පෙට්ටිවල එම එන්නත් අසුරා ඇත. මෙම එන්නත් තොගය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දී ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා විසින් ශ්‍රී ලංකාවට භාර දෙනු ඇත.**

**2. ඉතා සුවිශේෂී අහඹු සිදුවීමක් ලෙස කොවිෂීල්ඩ් එන්නත් තොගය පින්බර දුරුතු පොහොය දිනයේ දී දිවයිනට ළඟා වේ. සිය ධූරයේ වැඩ භාර ගැනීම උදෙසා 2020 මැයි මස වෙසක් සතියේදී, කොවිඩ්-19 වසංගතයට එරෙහිව ශ්‍රී ලංකාව ගෙන යන සටනට සහය වීම සඳහා ටොන් 12.5ක වෛද්‍ය සැපයුම් තොගයක් රැගෙන දිවයිනට පැමිණි මහ කොමසාරිස්තුමා මෙදින කොළඹ, ගංගාරාම විහාරස්ථානය වැඳ පුදා ශ්‍රී ලාංකීය ජනතාවගේ නීරෝගීභාවය සහ සුභසිද්ධිය ප්‍රාර්ථනා කරනු ඇත. එතුමා පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි හිමිපාණන්ගේ ආශීර්වාදය ද ලබා ගනු ඇත. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ බෞද්ධ සම්ප්‍රදායානුකූලව මහ කොමසාරිස්තුමා විහාරස්ථානයට පැමිණෙන බැතිමතුන්ට දානය ද පිළිගන්වනු ඇත.**

**3. ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනෙකා හි කොවිෂීල්ඩ් එන්නත ඉන්දියාවේ සීරම් ඉන්ස්ටිටියුට් විසින් නිපදවනු ලබයි. ශ්‍රී ලංකා රජය හදිසි භාවිතය සඳහා එම එන්නතට අනුමැතිය ලබා දී ඇත.**

**4. මෙම පරිත්‍යාගය කොවිඩ් වසංගතයට එරෙහි ශ්‍රී ලංකාවේ සටනට ඉන්දියාව අඛණ්ඩව ලබාදෙන සහයෝගයේ කොටසකි. ඉන්දියාව විසින් ටොන් 25ක පමණ වෛද්‍ය සැපයුම් තොග හතරක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කර ඇත. එසේම, ඉන්දියාව ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තිකයන් උදෙසා අත්දැකීම් බෙදාහදා ගැනීමේ වැඩසටහන් අන්තර්ජාලය ඔස්සේ සංවිධානය කරන ලදී. තව ද , කොවිඩ්-19 සටන සඳහා ඒකාබද්ධ පෙරමුණක් ද ස්ථාපිත කරමින්**

**සාක් කොවිඩ්-19 හදිසි අරමුදල සඳහා වැඩිම දායකත්වයක් ලබා දුන් රටවල් ද්විත්වය වන්නේ ද ඉන්දියාව සහ ශ්‍රී ලංකාවයි. අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා වසංගතය පාලනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නායකත්වයට ප්‍රශංසා කර ඇත.**

**5. සිය "අසල්වැසියා ප්‍රථමයෙන්" සහ සාගර්** (SAGAR) **ප්‍රතිපත්තීන්ට අනුව ඉන්දියාව කොවිඩ්-19 එන්නත් මාත්‍රා මිලියන 5ක් පමණ අසල්වැසි රටවලට සහ ගල්ෆ් සහ ඉන්දියානු සාගර කලාපයේ රටවලට 2021 ජනවාරි 20 වන දින සිට පරිත්‍යාග කර ඇත. ඉන්දියාවේ නිෂ්පාදනය කෙරෙන කොවිඩ්-19 එන්නත් මාත්‍රා මිලියන ගණනක් ලතින් ඇමරිකාව සහ බටහිර ආසියාව වැනි ඉතා දුරින් පිහිටි රටවලටද අපනයනය කර ඇති අතර එම එන්නත් කැරිබියන් සහ පැසිෆික් රටවලට ද ඉදිරියේදී ළඟා වනු ඇත. 2020 සැප්තැම්බර් මාසයේ දී ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානය අමතා ප්‍රකාශ කළේ ඉන්දියාවේ එන්නත් ධාරිතාවය කොවිඩ් වසංගතයට එරෙහිව සටන් කිරීම උදෙසා සමස්ත මනුෂ්‍යත්වයටම උපකාර කිරීමට යොදා ගැනෙනු ඇති බවයි. "ලෝකයේ ඔසු සල" යනුවෙන්ද හැඳින්වෙන ඉන්දියාව කොවිඩ් වසංගතයට මුහුණ දීම සඳහා රටවල් 150කට අත්‍යාවශ්‍ය ඖෂධ සපයා ඇති අතර ඉන් අඩකට වැඩි ප්‍රමාණයක් පරිත්‍යාග වශයෙන් ලබා දී ඇත.**

***

***කොළඹ***
***2021 ජනවාරි 27***